# උතුම් බුද්ධ සංඥාවෙහි සිත පහදවා ගැනීම නිවනටත් ස්වර්ගයටත් මඟකි

## රංසිසඤ්ඤකස්ථවිරාවදානය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ඛුද්දක නිකාය, අපදානපාළි 1 - පිටු අංක 364 - 365)

බුදු රජාණන් වහන්සේගේ තේජවන්ත වූ බුද්ධානුභාවය දුටු කෙනෙක් ඒ උතුම් බුද්ධ රශ්මියෙහි සිත පහදවා ගත්තා. සිතේ ප්‍රසාදය හා බුද්ධානුස්සති භාවනාව හේතුවෙන් කල්ප තිස් දහසක් ඔහු ඉපදුණේ සුගතියේ ම යි. මහා බල ඇති සක්විති රජ පදවියක් ද දැරුවා. ගෞතම සම්මා සම්බුද්ධ ශාසනයේ පැවිදි වී උතුම් රහත් බව ලැබුවා.